# අලුත් පොත්

## දම් පාටින්

### පුණ්‍යකාන්ති රාජපක්ෂ




ස්වර්ණකාන්ති රාජපක්ෂ පරිවර්තන කාර්යයේදී මෙන්ම ස්වතන්ත්‍ර නිර්මාණ සඳහාද එකසේ සමත්කම් දක්වන ලේඛිකාවකි. පරිවර්තන සඳහා දෙවරක් රාජ්‍ය සාහිත්‍ය සම්මාන දිනා ඇති ස්වර්ණකාන්තිගේ නවතම කෘතිය ඇලිස් වෝකර් ගේ ද කලර් පර්පල් කෘතියේ පරිවර්තනය වන " දම් පාටින්" ය. සමුද්‍ර වෙත්තසිංහ ප්‍රකාශනයක් වන "දම් පාටින්" පොත පිළිබඳ අදහස් දැක්වීමක් ළබන සන්නසේ බලාපොරොත්තුවන්න.




## හුස්ම

### ලක්ෂ්මන් කොඩිතුවක්කුගේ

නවතම කෙටිකතා සංග්‍රහය



පාස්ට් පබ්ලිෂින් ආයතනයේ ප්‍රකාශනයක් ලෙස එළි දක්වා ඇති මෙම නිර්මාණ සංග්‍රහයට කෙටිකතා එකොළහක් ඇතුළත්ය. පැය අටේ මිත්‍රයෝ යන කාව්‍යය සංග්‍රහය සහ පරමේෂ්වරී සහ වෙනම රටක් යන තම කුළුදුල් කෙටිකතා සංග්‍රහය තුළින් සාහිත්‍යයකරණයට පිවිසි ලක්ෂ්මන් ගේ එම කෙටිකතා සංග්‍රහය 2010 දී ගොඩගේ සාහිත්‍ය නිර්මාණ තරඟයේ අවසන් කෘති අතරට නිර්දේශ වී පාඨක අවධානයට නොමඳව පාත්‍ර විණි.

කෙටි නාට්‍යය හා ළමා කතා කිහිපයක්ම නිර්මාණය කර ඇති ලේඛකයා ඔස්ට්‍රේලියාවේ සිඩ්නි නුවර වාසය කරමින්, විප්‍රවාසී ලේඛකයෙකු ලෙස මව්බිම සමග තම අත්දැකීම් බෙදා හදා ගනිමින් නවතම කෙටිකතා කිහිපයක් මෙම කෘතියට ඇතුළත් කර ඇත.

ඔහු ඔස්ට්‍රේලියාව පුරා බෙදාහරින සිංහල පුවත්පතක් වන සන්නස මාසික සංග්‍රහයේ විශේෂාංග ලේඛකයෙකු වන අතර, ඔස්ට්‍රේලියාවේ සෙරන්ඩිබ් හා පහන පුවත්පත ආරම්භයේ සිටම එයට සමබන්ධව කටයුතු කළ එම පුවත්පත් ඉදිරියට ගෙනයාමට දිරිදුන් ලේඛකයෙකි.

ඔහු ලක්බිම ඉරිදා සංග්‍රහයේ මංජුසාව තීරයට කවි හා කෙටිකතා සපයන ලේඛකයෙකුද වේ. ජිවිතය විඳින්නට දිරි දරනා මිනිසුන්ගේ හද ගැස්ම යනුවෙන් හඳුන්වා ඇති මෙම හුස්ම කෙටිකතා සංග්‍රහය කියවා රස විඳින ලෙස ඔහු ශ්‍රී ලාංකික පාඨකයනට ආරාධනා කරයි.

## දුර රූපයේ ආවර්ජනය

### එස් පියසේන

සරසවි ප්‍රකාශකයෝ




ජ්‍යෙෂ්ට ජනමාධ්‍යවේදී එස් පියසේන ශූරින් වරින් වර පුවත්පත් සඳහා ලියන ලද ලේඛණ එකතුව "දුර රූපයේ ආවර්ජනය" නමින් මුද්‍රණයෙන් එළිදක්වා ඇත.

1942 වසරේදී ජනශක්තිය පුවත්පතේ සංස්කාරක ලෙස පුවත්පත් ලෝකයට පිවිසුණ එස් පියසේන ශූරින් 1948 දී ලේක්හවුස් ආයතනයට එක්විය. 1951 වසරේදී ලංකා ගුවන් විදුලියට ඔහු එක්වූයේ නිබන්ධක තනතුරටය. 1953 දී පාර්ලිමේන්තුවේ ක්ෂණික කතා පරිවර්තකයකු ලෙස සේවයට එක්වන පියසේන මහතා ඉන් පසු එක්වනනේ ඕල් ඉන්ඩියා ගුවන් විදුලියට ය. වසර 11 ක් එහි සිංහල අංශය මෙහෙයවූ එස් පියසනේ මහතා 1977 දී නැවත ලේක්හවුස් ආයතනයට එක්විය. ඉන්දියාවේ නියෝජ්‍ය ශ්‍රී ලංකා මහකොමසාරිස්වරයා ලෙසද සේවය කළ පියසේන මහතා මේ විශාල ක්ෂෙත්‍රයක විහිදුණ සිය අත්දැකීම් "දුර රූපයේ ආවර්ජනය" කෘතියෙන් පාඨකයාට තිළිණ කරයි.

ශ්‍රී ලංකාවේ මාධ්‍ය ක්ෂෙත්‍රයේත් දේශපාලනයේත් රසමුසු තැන් විචාරශීලී ලෙස ඉදිරිපත් කරන්නට ඔහු දක්වන සමත්කම කෘතියේ රසවත් බව සේම වැදගත් බවද ඉහළ නංවා ඇත. සිය තියුණු ස්මරණ ශක්තිය මෙහෙයවා ලියා ඇති මේ සියලු ලිපි එක සේ රසවත්ය.


LANKAN
AUTO CARE

Licensed Roadworthy Tester (R.W.C)



ALL MECHANICAL REPAIRS
LOG BOOK SERVICE | ELECTRICAL REPAIRS
AUTO TRANSMISSIONS | BRAKES & CLUTCHES
FUEL INJECTION | COMPUTER DIAGNOSTIC




Ranjith Perera
Mob: 0409 866 886

9798 2200
14/30 Tower Court
Noble Park 3174

LAND FOR SALE IN SRI LANKA
ETHULKOTTE - MALIGAWA ROAD

50 meters to Ethulkotte - Nugegoda Road
Ideal residential property
20 perches - Rs. 2.2 million per perch
Price negotiable

Contact : 0448 756 944 / 02 9476 3606

3 Plots of Residential Property
in Sri Lanka for sale,
Sri Lanka .

Owner migrated to Australia,
needs to sell following plots of land.
20 Perches with an old house at Sirigal Avenue , 300 meters to Kohuwala Junction. Price AUD 140 000/- (House not priced), nego-tiable

55 Perches In Kurunegala,
near Yanthampalawa junction on Puttalam road.
Price AUD 55000/- negotiable

40 Perches near Kurunegala on Puttalam Road , 6 Km from Kurunegala town, 1/2 Km from Pellandeniya junction.
Price AUD 25000/- negotiable

Owner 's Tele No.: 0 451186850,
email: ekanayake100@hotmail.com